# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 23 දරන පොල්ගහවෙල තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 07 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජූනි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි    තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 23 දරන පොල්ගහවෙල තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 07 වන දින.]

එල්. ඩී.—ඕ. 56/83.

## පොල්ගහවෙල තරුණ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

**පූර්විකාව.** "පොල්ගහවෙල තරුණ බෞද්ධ සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එහි සාමාජිකයන් එකඟ වන රීති අනුව, එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් පොල්ගහවෙල පිහිටුවා තිබුණු හෙයින් ද :

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් හා ඒ සමිතිය සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**ලුහුඬු නාමය.** 1. මේ පනත 1984 අංක 23 දරන පොල්ගහවෙල තරුණ බෞද්ධ සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**පොල්ගහවෙල තරුණ බෞද්ධ සමිතිය සංස්ථාගත කිරීම.** 2. (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) පොල්ගහවෙල තරුණ බෞද්ධ සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් හෝ මෙසින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් බඳවා ගනු ලබන තැනැත්තන් මේ පනත ආරම්භ වන දිනයෙහි සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) "පොල්ගහවෙල තරුණ බෞද්ධ සමිතිය" යන අභිධානය හා නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද, ඒ සංස්ථාව විසින් හා එයට විරුද්ධව එකී නාමයෙන් සියලු අධිකරණයන් හි නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ හා පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ නිලයෝ හා අධිකාරය එයට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.** 3. සංස්ථාව පිහිටුවීම අරමුණු කොට ගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙසින් ප්‍රකාශ කරනු ලැබේ :—

(අ) ප්‍රදේශයේ තරුණ පිරිසගේ බෞද්ධ හැඟීම් දියුණු කිරීම ;

(ආ) බුද්ධ ධර්මය පිළිපැදීමට ධෛර්යය දීම ;

(ඇ) බෞද්ධ තරුණ පිරිසගේ සමගිය සහ සහයෝගය දියුණු කිරීම ;

(ඈ) බෞද්ධ තරුණ පිරිසගේ අධ්‍යාත්මික, සංස්කෘතික, ශාරීරික හා සමාජයීය අභිවෘද්ධිය සැලසීම ;

(ඉ) බෞද්ධ සම්බන්ධතා වැඩි දියුණු කිරීම ; සහ

(ඊ) බෞද්ධ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.** 4. සංස්ථාවේ පරමාර්ථ ඉටු කිරීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් සහ පරිත්‍යාග භාර ගැනීමේ සහ එකතු කිරීමේ ද ස්වේච්ඡා පිරිස් සේවයේ

නියුක්ත කර ගැනීමේ, සේවයෙහි යෙදවීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියාවන් කිරීමේ ද කරුණු ඉටු කිරීමේ ද දේවල් ක්‍රියාවේ යෙදීමේ ද බලය, මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

5. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ නිලධරයන්ගෙන් සහ සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තා වූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නා වූ ද වෙනත් තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත විධායක කමිටුවක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත් ව, පරිපාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී ධුර දරන සමිතියේ විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

භාරකාර මණ්ඩලය.

6. (1) සංස්ථාවේ අනුශාසක, සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික යන තැනැත්තන්ගෙන් සමන්විත වන භාරකාර මණ්ඩලයක් වෙත, සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ සියලු නිශ්චල දේපළවල භාරකාරත්වය පවරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම භාරකාර මණ්ඩලය, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන අවස්ථාවේ දී ධුරය දරූ සමිතියේ භාරකාර මණ්ඩලය ම වන්නේ ය.

(3) භාරකාර මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් ම පමණක් භාරකාර මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කාර්ය පරිපාටියක් අවලංගු වන බව නොසැලකිය යුතු ය.

සංස්ථාවේ රීති.

7. (1) සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා සංස්ථාව විසින් කලින් කල සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු ඡන්දයෙන්, මේ පනතේ විධිවිධානවලට හා ප්‍රතිපත්තිවලට අනනුකූල නොවන රීති සාදනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු, එවැනි ම රැස්වීමක දී ඒ ආකාරයෙන් ම ඒවා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අය විය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පවත්නා වූ සමිතියේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර සමිතියට අය විය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාව විසින් චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව.

**9.** මිලට ගැනීමකින්, ප්‍රදානයකින්, ත්‍යාගයකින්, තෙස්තමේන්තු නියාදනයකින් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාව වෙත පැවරෙන යම් නිශ්චල හෝ චංචල දේපලක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපළ මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ රීතිවලට යටත්ව, විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

**10.** සංස්ථාවේ මුද්‍රාව සංස්ථාවේ භාරකාර මණ්ඩලය භාරයේ තිබිය යුතු අතර, එකී මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තවද ඒ සාමාජිකයන් දෙදෙනා ඒ අවස්ථාවේ දී පැමිණ සිටි බවට සලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු අතර ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සනට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**11.** මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් විසින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

**පාර්ලිමේන්තුවේ පනත්** කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල **(දේශීය)** රු. 150 කි. **(විදේශීය)** රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.